මෙම පාපොච්චාරණයේ මෙම චෝදනාවන් වලට අදාල කොටස් පැ.1(අ) සිට පැ.1(ඒ) වශයෙන් ලකුණු කරන ලදි.

පැ.1(අ) ලෙස,

*"2002 වසරේ උතුරු නැගෙනහිර සිදුවන දේශපාලන, ආර්ථික, සමුදාමය සහ කලා සම්බන්ධ විෂයන් සම්බන්ධයෙන් විමර්ශනය කර පුවත් පතක් නිකුත් කිරීමට සිදු වූ උනන්දුව නිසා North Eastern Herald යන පුවත්පත 2002 වර්ෂයේ ජූලි මස ආරම්භ කරන ලදි."* ලෙස කරන ලද කොටසින් සඳහන් කර ඇති පරිදි චූදිත, පුවත්පත් ආරම්භ කිරීම සම්බන්ධයෙන් පැමිණිල්ලේ සාක්ෂි ඉදිරිපත් වී ඇති අතර, එය විත්තියේ අභියෝගයකට ලක් වී නැත.

පැ.1(ආ) ලෙස,

*"යාපනයේදී කොටි ආයතනයේ සිටි ඉලම්පරදිව හම්බ වුණා."*

මෙයද, සාක්ෂිවලින් ඔප්පු වී ඇත. චූදිත වෙනුවෙන් සාක්ෂියට කැඳවූ සාක්ෂිකරුවන් චූදිත යාපනය ප්‍රදේශයට ගිය බව පැවසූ අතර, චූදිත විත්තිකූඩුවේ සිට කරන ලද ප්‍රකාශයේ ඔහු උතුරට ගිය බවත් L.T.T.E. නායකයින්ව හමු වූ බවත් කියා සිටින ලදි.

පැ.1(ඇ) සහ පැ.1(ඈ) ලෙස පාපොච්චාරණයේ මෙසේ සඳහන් වී ඇත.

පැ.1(ඇ) - *"2003 වර්ෂයේ අගභාගයේ හෝ 2004 වර්ෂයේ මුල් කාලයේ ජෙසිකරන් මාව හමු වී මාසික සඟරාවක් එළිදැක්වීමට හෝ ප්‍රකාශනය කිරීමට මට උදව් කිරීමට හැකි බව පැවසුවා. ඔහුගේ අදහස් අනුව මුද්‍රණය කිරීමට මූල්‍යාධාර ලබා දෙන බවත්, මා අවශ්‍යය ලිපි රුස්කර සඟරාවේ කර්තෘ වශයෙන් සිටින බව ඔහු පැවසුවා. ඉන්පසු 2004 පෙබරවාරි මස North Eastern Monthly යන*

*සඟරාව තිල වශයෙන් අංක 82, ශ්‍රීමත් බණ්ඩාරනායක මාවත, කොළඹ 12 දී ආරම්භ කරන ලදි."*

<u>පැ.1(ඇ)</u> - *"317, ජම්පටා වීදිය, ඊක්වලිටි ග්‍රැෆික්ස් ආයතනයේ මුද්‍රණය කරන ලදි."*

මෙය හැටන් නැෂනල් බැංකුවේ කළමණාකරුගේ සාක්ෂියෙන් තහවුරු වී ඇත.

<u>පැ.1(ඉ)</u> ලෙස *"North Eastern Monthly සඟරාව ප්‍රකාශයට පත් කරන අවස්ථාවලදී 2005 අවුරුද්දේ මගේ ජංගම දුරකතනයට කෙනෙකු අමතා ඔහු බාබා යනුවෙන් හඳුන්වා දුන්නා. ඔහු කිලිනොච්චියේ සිට අමතන බවත්, North Eastern Monthly පිළිබඳව දැන ගත් බවත් පැවසුවා. ඒ වගේම මාව කොටින්ගේ පාලන ප්‍රදේශයේ සිදු වන විෂයයන් සම්බන්ධයෙන් වුවත් ඒ සම්බන්ධයෙන් මාගේ සඟරාවේ ලිවීමට හැකි බවත්, මාව කිලිනොච්චියට ඇරයුම් කළා. මාත් සාම කාලය නිසා ඔහුගේ ඇරයුම පිළිගෙන 2005 අවුරුද්දේ මැද හෝ අග භාගයේ කිලිනොච්චි ගියා."*

මෙම ලකුණු කරන ලද එකී කොටසින් වූදිතගේ දුරකතනය සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද Dialog ආයතනයේ වාර්ථා වල මෙම දුරකතනයෙන් කිලිනොච්චියට ඇමතුම් ලැබී ඇති බව සඳහන් කර ඇත. එකී දුරකතනයේ ලියා පදිංචි අයිතිකරු කියා සිටියේ ඔහු එම දුරකතනය වූදිතගේ භාරයට දුන් බවත්, ඔහුට දුන් පසුව තමා ඉන් ඇමතුම් ලබා නොගත් බවයි. මේ අනුව වූදිත එකී දුරකතනය භාවිතා කළ බව ඔප්පු වී ඇති අතර, ඔහු අත්අඩංගුවට ගන්නා අවස්ථාවේදී එය ඔහු සතුව තිබී ඇත. මෙම සාක්ෂියෙන් එකී පාපෝච්චාරණයේ සඳහන් කොටස තහවුරු වී ඇත.

අභියාචන අංශය
03 SEP 2009



පැ.1(ඊ) ලෙස සහ පැ.1(උ) ලෙස මෙම කොටස් පාපොච්චාරණයේ මෙසේ ලකුණු කරන ලදි.

පැ.1(ඊ) - "වව්නියාව දක්වා නගරාන්තර බස් රථයකින් ගොස් ඉන් පසුව තාන්ඩිකුලම පසු කර කොටින්ගේ ප්‍රදේශයේ ආත්ගුමති හමු වුනා. ඉන් පසුව බාබාව හමු වුනා. බාබාගෙන් පසුව ආර්චිය බාලතී, දේවගැති කරුණාරත්නම්, බී.බාලකුමාර්, එස්.පී.තමිල්චෙල්වම්, බාල් රාජ් යන අයව හමු වුනා. මොවුන් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කලා. මෙහිදී ආර්ය බාලතී උතුරු නැගෙනහිර සිදු වන මානව හිමිකම් උල්ලංඝනය කිරීම පිළිබඳවත්, එල්.ටී.ටී.ඊ. සාම කාර්යාලයෙන් සිදු වන ක්‍රියාවන් සම්බන්ධයෙනුත් පැවසුවා. දේවගැති කරුණාරත්නම් උතුරු නැගෙනහිර මානව හිමිකම් මහ ලේකම් කාර්යාලය සිදු කරන කාර්ය භාරය පිළිබඳවත් පැවසුවා. ඒත් එක්කම බී.බාලකුමාර් ලංකාවේ උතුරු පලාතේ දේශපාලන විෂයන් සම්බන්ධයෙනුත්, යුද්ධය පටන් ගැනීමේ අවස්ථාවක ශ්‍රී ලංකා ආණ්ඩුව තීරණය කර පැමිණි බවත් පැවසුවා. ඉන් පසුව බාල්රාජ් කොටින්ගේ ඉකුත් යුද්ධවලදී ලබා ගත් ජයග්‍රහනය පිළිබඳවත් කොටින් නැවත යුද්ධය ආරම්භ වුනොත් යුධ කිරීමට ලැස්තියෙන් සිටින බවත් පැවසුවා. එස්.පී තමින්චෙල්වම් ලංකාවේ දේශපාලන ක්‍රියාවන් අනුව නැවත යුද්ධය ඇති වීමට ඉඩ තිබෙන බවත් පැවසුවා."

පැ.1(උ) - "ඉන්පසුව පොඩි බෝට්ටු නිශ්පාදනය කරන තැනකටත්, සුළු වශයෙන් කුඩා ජල යෝජනා ක්‍රමයක් මගින් එළවළු වවන වත්තකටත් ගියා. ඉන් පසුව දින 2, 3 කට පසුව කොළඹට පැමිණියා. කිලිනොච්චියේ දැකපු සමහර විෂයන් සම්බන්ධයෙන් නෝත්ර්ස්ටන් මන්ත්ලී සහරාවේ ලිව්වා. ඉන් පසුව 2006

03 SEP 2009



පෙබරවාරි මස නැවත ගියා. මෙම අවස්ථාවේ කලානිදි මාලාව කිලිනොච්චියේ රාජ්‍ය නොවන සංවිධානයේ සම්බන්ධීකාරක ගනේෂනාදන්ව, එස්.පී.තමිල්වෙල්වම් යාපනයේ සිට ප්‍රශ්න හේතුවෙන් කිලිනොච්චියට පැමිණ සිටින අවතැන් වූ ජනතාවද හමු වූනා."

<u>පැ.1(එ)</u> - "බාබා තමා මගේ ගමන දෙවතාවක්ම ලැස්ති කලේ. මා පිමිණි පසුව ඔහු සමඟ තොරතුරු, ප්‍රවෘත්ති රුස් කිරීමට අවස්ථා කිහිපයකදී බාබා සමඟ කතා කර තිබෙනවා. කොළමට පැමිණීමෙන් පසු නෝත්ඊස්ටන් මන්ත්ලි මගින් 2005, 2006 අවුරුදුවල සාමාන්‍යයෙන් සෑම මසකම ප්‍රකාශයට පත් කෙරුවා. 2006 වසරේ මැද හෝ අග භාගයේදී එක් අවස්ථාවක බාබා සමඟ කතා කරන කොට බාබා නෝත් ඊස්ටන් මන්ත්ලී වෙත උදව් කිරීමට මුදල් ලබා දෙන බව පැවසුවා. මා එපා කිව්වා. මෙයට හේතුව මූල්‍යය පහසුකම් අඩුවෙන් තිබුනත් අපිට සහරාව පවත්වාගෙන යාමට හැකියාව තිබුනා. ඒ සමඟම මා පැවසුවා මෙසේ මුදල් කොටින්ගෙන් ලැබුනොත් ප්‍රශ්නයක් වෙයි ඒ නිසා කරුණාකර එපා කියලා කිව්වා. ඉන්පසුව අවස්ථා දෙක, තුනකදී ඇසූ පසු මා අවශ්‍යයි කියලා කිව්වා. නමුත් 2006 අවුරුද්දේ අග හෝ 2007 අවුරුද්දේ මුල රුපියල් 50,000/- ක් වටිනා මුදල් රෙනෙයසන්ස් පබ්ලිකේෂන් එකේ හැටන් නැෂනල් බැංකුවේ ගිණුමට බැර කර තිබුණා. මෙම ගිණුම් අංකය කිලිනොච්චියේ උදේන් ස්ටෝස් සිට බාබා ලබා ගත් බව මා විශ්වාස කරනවා. රුපියල් 50,000/- ක මුදල් අවස්ථා තුනක තැන්පත් කර තිබුනා. මේ පිළිබඳව දැන ගත් පසු බාබාට කරුණාකර මෙසේ මුදල් බැර නොකරන ලෙසත්, මෙයින් ප්‍රශ්නයක් ඇති විය හැකි බවත් පැවසුවා."

අභියාචන අංශය
03 SEP 2009



<u>පැ.1(ඒ)</u> - *"බාබා මාස දෙකකට සැරයක් රුපියල් 50,000/- බැර කරන බව පැවසුවත්, මා දන්නා විදිහට අවස්ථා තුනකින් මුදල් බැර කිරීම නවතන ලදි. මෙම මුදල් සමග එක් අවස්ථාවක රුපියල් 5,000/- ගෙවන ලදී. මෙම මුදල් ටෙලි ග්‍රැෆික් ට්‍රාන්සර් ආකාරයන් ගෙවන ලදි."*

මෙම පාපොච්චාරණයේ මෙම කොටස් හැටන් නැෂනල් බැංකුවේ කළමණාකරුගේ සාක්ෂියෙන් සහ ඔහු විසින් ලකුණු කරන ලද ලියවිලි වලින් තහවුරු වී ඇත.

මේ අනුව චූදිත විසින් කරන ලද පාපොච්චාරණය සහ එම පාපොච්චාරණය සම්බන්ධයෙන් පැමිණිල්ල විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින් ඉහත සඳහන් චෝදනාවන් වලට අදාල වන <u>පැ.1(අ)</u> සිට <u>පැ.1(ඒ)</u> දක්වා කොටස් තහවුරු වී ඇති බව තිරණය කරමි.

විත්තිය විසින් කරන ලද දිර්ඝ දේශනයේදි කියා සිටියේ, මෙම චූදිතගේ North Eastern Monthly සඟරාවේ කරන ලද ප්‍රකාශ වලින් ජාතින් අතර අසමගියක් ඇති වී, අපරාධයක් සිදු විය නොහැකි බවයි. ටිබෙට් ජාතික එස් මහින්ද හිමි සහ අනගාරික ධර්මපාලතුමා යන අය විසින්ද ජාතිවාදි හැගිම් ඇති කළ ප්‍රකාශ කළ බවත්, මේ අනුව චූදිතගේ ප්‍රකාශයේ චූදිත විසින් ලියන ලද්දේ එවැනි ප්‍රකාශයක් වන බැවින්, මෙයින් ජනවාර්ගික අසමගියක් ඇති නොවන බවත් කියා සිටින ලදි. අනගාරික ධර්මපාලතුමාගේ යුගය සහ වර්තමාන තත්ත්වය එක හා සමාන කළ නොහැක.

චූදිත විසින් ඔහු කිසිවෙකුගෙන් මුදල් ලබා නොගත් බවත්, පාඨකයින් විසින් සඟරාවේ ගිණුමට මුදල් තැන්පත් කළ බවත් කියා සිටින ලදි. ඔහුගේ

03 SEP 2009



පාපොච්චාරණයේ බාබා ඔහුට එපා කියද්දී ගිණුමට මුදල් දැම්ම බවත් පවසා ඇත. බාබා බලෙන් ගිණුමට සල්ලි දැම්මා නම් චූදිත එම මුදල් ගත්තේ ඇයි ? එකී ගිණුමට බැර කරන සියළුම මුදල් චූදිත විසින් ආපසු ලබාගෙන ඇත. මෙයින්ම ඔහු ත්‍රස්තවාදී කණ්ඩායමකින් ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීම සහ ඒ මගින් ගැටුම් ඇති කිරීමේ චේතනාවෙන් මුදල් ලබා ගත් බව තහවුරු වෙයි.

පැ.1 ලෙස ලකුණු කර ඉදිරිපත් කර ඇති චූදිත විසින් 09.05.2008 දින කරන ලද පාපොච්චාරණය ස්වෙච්ඡාවෙන් කරන ලද එකක් බව විමසීමකට පසු මෙම අධිකරණය විසින් පිළිගෙන ඇත. චූදිත විසින් කරන ලද පාපොච්චාරණයක් මෙසේ පිළිගත් අවස්ථාවකදී නීතිමය වශයෙන් එය පාපොච්චාරණ සිදු කළ තැනැත්තාට එරෙහිව යොදාගත හැකිය. ***"රජ එදිරිව සිද්ධා - 20 නව නීති වාර්තා, 190 නඩුවේදී``*** චූදිතයෙකු විසින් කරන ලද පාපෝච්චාරණයක් ස්වේච්ඡාවෙන් කරන ලද පාපෝච්චාරණයක් බවට පිළිගත් අවස්ථාවකදී එහි අදාල කරුණු එම චූදිතට විරුද්ධව සාක්ෂියක් ලෙස යොදාගත හැකි බවත් තීරණය කර ඇත. ***"නාගමනී තේවේන්ද්‍රන් එදිරිව නීතිපති SC 65/2000 නඩුවේ``*** මාර්ක් ප්‍රනාන්දු විනිශ්චයකාරතුමා, පාපෝච්චාරණයේ සඳහන් කරුණු බාහිර සාක්ෂි මගින් තහවුරු කිරීම අනිවාර්ය කාරණයක් නොවන බවට නඩු තීන්දුවේ සඳහන් කර ඇත. තවද, ***"තල්ලරත්නම් සිංහරාජා එදිරිව නීතිපති නඩුවේදීද,``*** ස්වේච්ඡාවෙන් කරන ලද පාපෝච්චාරණයක තිබෙන සාක්ෂි මත පමණක් වුවත් විත්තිකරුවෙකු වරදකරුවෙකු කිරීමට හැකි බව තීන්දු කර ඇත. ***"58 නව නීති වාර්තාවේ 472 පිටුවේ සඳහන් රැජින එදිරිව එච්.සිසිලින් නඩුවේදී,``*** පාපෝච්චාරණයක ස්වේච්ඡාභාවය තීරණය කිරීමේදී එය

03 SEP 2009



සාක්ෂි ආඥා පණතේ 24 වන වගන්තියේ තිබෙන තත්ත්වයන් උල්ලංඝනය කර නැතිනම්, එවැනි අවස්ථාවක පාපෝච්චාරණය ස්වේච්ඡාවෙන් කළ එකක් ලෙස සලකා බැලිය හැකි බව සඳහන් කර ඇත.

ඉහත සඳහන් කරන ලද නඩු තීන්දුවල ස්වේච්ඡාවෙන් කරන ලද පාපෝච්චාරණයක සඳහන් කරුණු මත විත්තිකරුවෙකු වරදකරුවෙකු කළහැකි බව සඳහන් කර තිබෙන අතර, මෙම නඩුවේදී එකී පාපෝච්චාරණයේ සඳහන් පිළිගත් කරුණු වලට අමතරව එකී කරුණු තහවුරු කිරීම සඳහා වෙනත් සාක්ෂි පැමිණිල්ල විසින් ඉදිරිපත් කර ඇත.

ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පණතේ 2 (1) (ඌ) වගන්තිය යටතේ ඉදිරිපත් කර ඇති 1 වන සහ 2 වන චෝදනාවන් ඔප්පු කිරීමට ඉදිරිපත් කරන ලද, චූදිත විසින් පළකරන ලද උධෘතවලින් එකී වගන්තියේ සඳහන් වරදවල් සිදුවී ඇත්ද යන්න සලකා බැලීමේදී පහත සඳහන් නඩු තීන්දු අදාළ වන බව පැමිණිල්ලෙන් කියා සිටින ලදී.

*"ඉන්දියානු අපරාධ නඩු විධාන සංග්‍රහයේ 153 (ආ) වගන්තිය"* මෙම වගන්තියට බොහෝ සෙයින් සමාන වේ. *"සත්‍යරංජන් බාක්ෂි එදිරිව රජ, AIR 1929 කල්කටා 309".* මෙහිදී චූදිත විසින් දුම්රිය අනතුරකින් මියගිය පුද්ගලයින් සංඛ්‍යාව 200 ක් බවට පළකරන ලද අතර, ඇත්තටම මියගිය සංඛ්‍යාව 50 ක් වේ. ඔහු මෙය පළකර ඇත්තේ ඔහුට ලැබුණු ලිපියක් විදියටය. එහිදී ඉන්දියානු අධිකරණය මෙසේ සඳහන් කර ඇත.

*"If the words used naturally, clearly and indubitably have the tendency to incite one community against another then the intention to do it should be inferred."*

මෙහිදි චූදිතගේ අදහස කුමක්ද යන්න බැලීමට ඇත්තේ පළකර ඇති වචන සලකා බැලීමෙන් පසුව මිස ඔහු කියන දේ සලකා බැලීමෙන් නොවේ යයි සඳහන් කර ඇත.

*"Morgan Vs Odhams Press Ltd and another 1971 2 AER 1156* සහ *Hough Vs London Express Newspapers Ltd. 1940 2 K B 507* කෙරෙහි ***Baba ao Patel Vs. State "***

කෙරෙහි අධිකරණයේ අවධානය යොමු කරන ලදි. මෙම නඩු තීන්දුවල සඳහන් කර ඇත්තේ, යම්කිසි පළකිරීමක් කරන විට එය පළකරන පුද්ගලයා එය කියවන තැනැත්තන්ගේ ස්වභාවය සැලකිල්ලට ගතයුතු බවයි. එනම්, සාධාරණ පුද්ගලයෙක් එය කියවා කුමන අයුරකට ක්‍රියා කරයිද යන්න එය ලියන තැනැත්තා සැලකිය යුතු බවයි.

චූදිත වෙනුවෙන් ඉදිරිපත් කරන ලද දේශනවලදී, පාපෝච්චාරණය ස්වේච්ඡාවෙන් කරන ලද බව ප්‍රකාශ කරමින් මෙම අධිකරණයෙන් දෙන ලද නියෝගය අඩුපාඩු සහිත බවත්, එහි අදාල කරුණු සැලකිල්ලට ගෙන නොමැති බවත් දීර්ඝ වශයෙන් කියා සිටින ලදී. මෙම අධිකරණය මගින් දෙන ලද එකී තීන්දුව වැරදි නම් එයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට චූදිතට අවස්ථාව තිබූ අතර, චූදිත එසේ

03 SEP 2009



නොකර මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කරුණු දැක්වීම මෙම නඩු විභාගයට අදාල වන්නේ නැත.

චූදිත වෙනුවෙන් පැමිණිල්ලේ සාක්ෂි බිඳහෙලීමේ අදහසින් පහත සඳහන් නඩු තීන්දු ඉදිරිපත් කරන ලදී.

*"The Queen vs Somapala 69 NLR 465 R Vs Stean 1947 K B 997".*

මෙම නඩු තීන්දු දෙකම මෙම නඩුවට කිසිසේත්ම අදාල වන්නේ නැත.

*"Manzar Sayeed Khan Vs State of Maharashtra 2007 INSC 365"* යන නඩුවේ ඉන්දියානු ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවට මෙම අධිකරණයේ අවධානය යොමු කරන ලදී.

*"The intention has to be judged primaricy by the language of the book and the circumstances in which the book was written and published".*

මෙහි සඳහන් කර ඇති ආකාරයට කර්තෘගේ චේතනාව, ලියා ඇති වචනවලින් සහ එය ලියන ලද කාලය හෝ අවධිය යන බාහිර කරුණු අනුව සැලකිල්ලට ගත යුතුය. මෙම නඩුවේදී චූදිත මෙකී ලිපි ලියා ඇත්තේ උතුරු නැගෙනහිර යුද්ධයක් පැවති අවස්ථාවක වන අතර, ඇත්ත සිද්ධීන් විකෘති කරමින් බව සාක්ෂි වලින් තහවුරු වී ඇත. මේ අනුව මෙම නඩු තීන්දුවේ සඳහන් කර ඇති ආකාරයට චූදිතගේ චේතනාව, ඔහු ලියා ඇති භාෂා විලාශය, අවස්ථාව අනුව තීරණය කළයුතුය.

*"Bilal Ahmed Kabo Vs State of Andhra Pradesh 1997 INSC 646"* යන නඩු තීන්දුව මෙම නඩුවේ කරුණු වලට අදාල වන්නේ නැත.

6

*"Ramesh Chotalal Dalal Vs Union of India and others AIR 1988 SC 775"* නඩු තීන්දුවේ ප්‍රකාශ කර ඇත්තේ, වචනවල ප්‍රතික්‍රියාව දුර්වල මනසක් ඇති මිනිසෙකුගේ මට්ටමින් මැනිය නොහැකි බවයි. මෙම නඩුවේදී සලකා බැලිය යුත්තේ සාමාන්‍ය මනසක් ඇති පුද්ගලයෙක් මෙය තේරුම් ගන්නා ආකාරය ගැනයි.

විත්තිය වෙනුවෙන් තවදුරටත් *"Emperor Vs Banomah Mahorana"* නඩුවද ඉදිරිපත් කරමින් කියා සිටියේ, චූදිත සත්‍ය වශයෙන්ම අසාධාරණය වෙනුවෙන් කථාකල පුද්ගලයෙක් බවත්, ඔහුට ප්‍රචණ්ඩත්වයක් ඇතිකිරීමට චේතනාවක් නොතිබුනු බවත්ය. ඔහුට එවැනි චේතනාවක් තිබුනා නම් වාහරේ ප්‍රදේශයේ සිදුවූ දෙයට වඩා වෙනස් දෙයක් මිනැකමින්ම සත්‍ය විකෘතිකර පළකලේ මන්ද ? මේ අනුව විත්තියේ මෙම තර්කයද මෙහිදී අදාල වන්නේ නැත.

මේ අනුව චූදිතට විරුද්ධව ඇති 1 වන සහ 2 වන සහ 3 වන චෝදනාවන් සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින්ම ඉදිරිපත් කරන ලද සියලු සාක්ෂි සහ තර්කයන් සහ නඩු තීන්දු සැලකිල්ලට ගැනීමේදී, පැමිණිල්ල විසින් නඩුව සාධාරණ සැකයෙන් තොරව ඔප්පුකර ඇති බව පෙනී යයි. විත්තිය විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි වලින් පැමිණිල්ලේ සාක්ෂි කෙරෙහි සැකයක් මතු කිරීමට නොහැකි වී ඇති බවත්, එම සාක්ෂි පිළිගත නොහැකි මට්ටමක තිබෙන බවත් තීරණය කරන අතර, ඒ අනුව විත්තියේ සාක්ෂි ප්‍රතික්ෂේප කරමි.

අධිචෝදනා පත්‍රයේ චූදිතට විරුද්ධව ඇති පලවන චෝදනාව පැමිණිල්ල විසින් සාධාරණ සැකයකින් තොරව ඔප්පු කර ඇති බවට තීන්දු කරමි. ඒ අනුව චූදිත අධිචෝදනා පත්‍රයේ ඇති 01 වන චෝදනාවට වරදකරු කරමි.

අධිචෝදනා පත්‍රයේ චූදිතට විරුද්ධව ඇති දෙවන චෝදනාව පැමිණිල්ල විසින් සාධාරණ සැකයකින් තොරව ඔප්පු කර ඇති බවට තීන්දු කරමි. ඒ අනුව චූදිත අධිචෝදනා පත්‍රයේ ඇති 02 වන චෝදනාවට වරදකරු කරමි.

අධිචෝදනා පත්‍රයේ චූදිතට විරුද්ධව ඇති තුන්වන චෝදනාව පැමිණිල්ල විසින් සාධාරණ සැකයකින් තොරව ඔප්පු කර ඇති බවට තීන්දු කරමි. ඒ අනුව චූදිත අධිචෝදනා පත්‍රයේ ඇති 03 වන චෝදනාවට වරදකරු කරමි.

අත්/කළේ..........

(දීපාලි විජේසුන්දර)

මහාධිකරණ විනිසුරු - අංක.01.

2009.08.31.

---------- ---------- ---------

මෙහි පිටු අංක. 01 සිට 42 හි දැක්වෙන්නේ කොළඹ මහාධිකරණ නඩු අංක.HC 4425/2008 දරණ නඩුවේ 2009.08.31 දිනැති තීන්දුවේ සත්‍ය පිටපතක් බවට මෙයින් සහතික කරමි.

රෙජිස්ට්‍රාර්.

සැකසුවේ :-

සැසඳුවේ :-